# සබ්බාසව සූත්‍රය සටහන් 2

My immense gratitude to the great Noble council of Akanitta brahma realm

23/12/2014

1. තමා ඇත යන දෘෂ්ඨිය. (වේදනාව තමා යැයි ගනී)– ‘අත්ථි මෙ අත්තා’ති.
2. තමා නැත යන දෘෂ්ඨිය. (වේදනාව නැතිවිට තමා නැත යැයි ගනී)– ‘නත්ථි මෙ අත්තා’ති.
3. මම් ම තමාව හැඳින ගනිමියි යන දෘෂ්ඨිය. (රූපය සහ වේදනාව තමා යැයි ගනී) - ‘අත්තනාව අත්තානං සඤ්ජානාමී’ති.
4. මම් ම තමා නැත යැයි හැඳින ගනිමියි යන දෘෂ්ඨිය. (නිත්‍යය රූපය තමා, වේදනාව තමා නොවේ) - අත්තනාව අනත්තානං සඤ්ජානාමී’ති.
5. තමා නොවූ මම් ම තමාව හැඳින ගනිමියි යන දෘෂ්ඨිය. (රූපය තමා නොවේ, වේදනාව තමා යැයි ගනී)– ‘අනත්තනාව අත්තානං සඤ්ජානාමී’ති. උදාහරණය: අඹ ගෙඩිය තමා නොවේ, එසේ වුවත් අඹ ගෙඩිය කෑමෙන් ඇතිවන වන වේදනාව තමා යැයි ගනී.
6. කථාකරන්නාවූ සැප දුක් විඳින්නාවූ මම ඒ ඒ ජාතියෙහි කළ කුශල අකුශල කර්මයන්ගේ විපාකය විඳියිද, මාගේ ඒ මේ තෙම නිත්‍යය, ස්ථිරය, හැමදාම පවතියි. නොපෙරළෙන ස්වභාව ඇත්තේය. (උදාහරණය: දිග සිහින් පුවරුව (surfboard)- සුළඟ නැති වූ විට වේදනාව නැතිවෙන බව නොදනී)

- මෙම දෘෂ්ඨි 6 ඉදංසච්චාභිනිවෙසො කායගන්ථය ඇතුලට ඇදේ. ආශ්‍රව වලදී සාකච්ඡා කරන ලද ආකාරයටම සමානව, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථයේ සිට පියෙහි විප්පයොග දක්වා සමාන්තර රේඛාවක් පසු සංඥාවක් නිරූපනය කරමින් පවතී.(ඊළඟ පිටුව බලන්න).
- ඉදංසච්චාභිනිවෙසො කායගන්ථයට යමක් ඇතුල්වූ විගසින් පියෙහි විප්පයොගය සිදුවේද?
- එය එසේ නොවේ. පියෙහි විප්පයොගය සිදුවන්නේ පරාමාස ගතවීමෙන් පසුව වේ.

- කුමකට මිච්ඡාදිට්ඨි වූයේද? පදුට්ඨ මන සංඛල්පය නිසා ඇතිවූ නිත්‍යය භාවයම හේතුවිය, ප්‍රත්‍යය විය යනුවෙන් වත්ථූපම සටහන්හි 9 වන පිටුවේදී ඉගෙන ගත් බව සිහිකරන්න.

# ජරා ධර්මය (ජරාධම්ම)

රූපයත්, රූපය නිසා මම පවතිනවා යන දෘෂ්ඨිය බිඳීම රූපයේ ජරා ධර්මය වේ.




විඤ්ඤාණයේ හට ගැනීම සටහනේ, A සිට B දක්වා යෑම ජාති (ජාතිය) වශයෙන් සැලකිය යුතුය. මෙය කොළ පාට රේඛාවට අනුරූප වේ. විඤ්ඤාණ දහරාවේ යම් වෙනසක් දැන ගැනීමක් වේද මෙය දුකය. B සිට C දක්වා යෑම ජරා (ජරාව). මෙය රතු පාට රේඛාවට අනුරූප වේ. මෙය ජරා ධර්මය ලෙස සැලකිය යුතුය. මෙය සිදුවන්නේ **3** වන රවුමේදීය. **3** වන රවුමේදී සුඛ යැයි ගන්නා බව අපි දනිමු.

- A ලක්ෂණය 'සංස්කාර ප්‍රත්‍යය කොට විඤ්ඤාණය වෙයි' ලෙස සැලකිය යුතුය(සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං).
- B ලක්ෂණය 'විඥානය ප්‍රත්‍යය කොටගෙන නාම රූප වෙයි' ලෙස සැලකිය යුතුය(විඤ්ඤාණපච්චයා නාමරූපං). B ලක්ෂණයට පැමිණියා නම් එහි කර්මය අඩංගුය.
- C ලක්ෂණය 'නාම රූප ප්‍රත්‍යය කොට ෂඩායතනය වෙයි' ලෙස සැලකිය යුතුය(නාමරූපපච්චයා සළායතනං).

## ව්‍යාධි ධර්මය (බ්‍යාධිධම්මා)

නිත්‍යය යන සංකල්පය බිඳීම නිසයි ව්‍යාධි ධර්මය




- 1 සහ 3 දෙකම එකසමානය. නිත්‍යය ගුණය මෙම 1 සහ 3 තුළ පවතී.
- 2 සහ 4 දෙකම එකසමානය. සුභ යැයි ඉදංසච්චාභිනිවෙසො කායගන්ථයට ඇතුල්වේ. 2 නොවන්නේ නම් 4 නැත. මේ දෙක අතර ඇති වෙනස, 3 –නිත්‍යය භාවය, පුනපුනා ස්පර්ශ කිරීමයි.
- 3 වන රවුමේ 3 වන පියවරේදී සුබය පරාමාස ගතවේ. මේ වන විට ජරා ධර්මය සිදුවී ඇත. එනමුදු අපි එය අත්තා යැයි ගන්නෙමු.
- අත්තා යැයි ගැනීමම රෝගයකි (රොගං (රොදං) වදති අත්තනො) (Pe Eng page 31, Pe S P36)
- 3 වන රවුමේ 6 වන පියවරේදී ව්‍යාධි ධර්මය සිදුවේ. මෙය රූපය නිසා ඇතිවූ ව්‍යාධියකි .

# මරණ ධර්මය (මරණධම්ම)

**3 වන රවුමේ 3 වන පියවරේදී (3–3), රූපයේ ජරා ධර්මයට යටත් විය. 4 වන රවුමේ 3 වන පියවරේදී (4–3), වේදනාවේ ජරා ධර්මය වේ. මෙහිදී අප රෝගී වී ඇත (3–6 රූපය නිසා ව්‍යාධි වූ බව සිහි කරන්න). යමක් කැඩුන විට, මම හොඳ එකක් හදමි යැයි සිතයි. පලාසය භාවිතා කර නැවත විඤ්ඤාණය සාදයි. මේ ආකාරයට 4 වන රවුමේ 4 වන පියවරේදී (4–4) ජාතිය ඇතිවේ.**

- **(4–3) වේදනාවේ ජරා ධර්මය, (4–4) ජාතිය. එසේ නම්, මරණය කුමන රවුමේ දී සිදුවෙයිද?**
- **(4–2) දී මරණය. එසේ නම් අපි නිත්‍යය යැයි ගෙන ඇත්තේ විඤ්ඤාණයේ මරණය නේද?**
- **2 වන රවමේදීත් මරණය සිදුවේ. එය රූපය නිසා වන මරණයයි.**
- **(4–3) වේදනාවේ ජරා ධර්මය, (4–4) නැවත ඉපදවීම. (4–6) වේදනාවේ ව්‍යාධිය. මෙය ‘අකමැති දෙය හා එක්වීම වන්නේය’ (අප්පියෙහි සම්පයොග).**

4-4
ජාති

5-3
ජරා

4-3
ව්‍යාධි

4-2
මරණ

7-7
උපායාස

4-7
පියෙහි
විප්පයොගො

4-6
අප්පියෙහි සම්පයොග

4-5
යම්පිච්ඡං න ලභති තම්පි
දුක්ඛං

- 4-5 – “කැමතිවූ යමක් නොලබාද එයද දුකය (යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං)” වන්නේය. මෙය සිදුවන්නේ ’අත්තා’ යැයි ගැනීමෙන් පසුවය. අත්තා -> 1.3 මෝහ (තයොධම්ම සූත්‍රය) සහ මෙයට සමාන්තරව
  ව්‍යාධි -> යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං
- යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛය තුළ අත්ත සංඥාව ඇතුලත් වී ඇත.




- 4-7 - කැමති දෙයින් වෙන්වීම (පියෙහි විප්පයොගො) වන්නේය. බබා වගේ රූපයෙන් වෙන්වුනා (4-2 – මරණය), එවැනි රූපයකින් සිටීමට ඇති කැමත්ත (නන්දි).
- 5-3 සංඥාවේ ජරාව වන්නේය. නිත්‍යය යැයි ගත් සංඥාව වෙනස්වී ඇත. 4-7 සිදුවී ඇත. එසේ නම් නිත්‍යය යැයි ගැනීම නිෂ්ඵලය.
- 7-7 - උපායාස. මැරුණු මනුෂ්‍යයාට දැඩි වෙහෙසක් ඇත. මෙහිදී ‘ක්‍රොධයවූ දැඩි වෙහෙස’ (කොධූපායාසො) ගැන සිතන්න. 7-7 - සංස්කාර ජරා වශයෙන් සැලකිය හැක.

## ආශ්‍රව සහ රවුම් අතර සම්බන්ධතාවය

- කාමාශ්‍රව වන්නේ 4-4 න් පසුවයි. එනම් සුඛය පරාමාස වීමෙන් පසුවයි.
- භවාශ්‍රව වන්නේ අත්ත සංඥාව වීමෙන් පසුවයි. මෙය 5 වන රවුමෙන් පසුව සිදුවේ.
- 8 වන රවුමේදී සංස්කාර වලට අගය දීම සිදුවේ. දිට්ඨි ආශ්‍රව 8 වන රවුමෙන් පසුව සිදුවේ.
- අවිද්‍යා ආශ්‍රව 10 වන රවුමෙන් පසුව සිදුවේ.

How we get wrong views from Petakopadesa and Abhidhamma pitaka




Note: There are other links between sates below these lines which are not present in this diagram

- ක්ෂේත්‍ර 1 (area 1) සහ ක්ෂේත්‍ර 2 අතර වෙනස, ආයතන–2 පිටුව 2 හි සාකච්ඡා කරන ලදි.
- මෙම වෙනස ඇතිවීමට නම් ක්ෂේත්‍ර 2 ට යමක් එකතුවී තිබිය යුතුය.
  - පළවෙනි හේතුව ජරාවට යෑම.
  - දෙවෙනි හේතුව ගති ලක්ෂණ.
- ගති ලක්ෂණ කෙසේ ඇතිවූයේද?
  - අනුසය වූ ධර්මයෝමය
- අනුසය වූ ධර්මයෝ කෙසේ ඇති වන්නේද?
  - ආශ්‍රවයෝ නිසාය.




- චේතනා වීමෙන් පසුව දකුණු පැත්තේ ධර්මයන් වම් පැත්තට එන්නේය.
- දැන් කාමාශ්‍රව වලට අවිද්‍යා ආශ්‍රව, දිට්ඨි ආශ්‍රව වලින් සංස්කාර වලට ඇලීම නිසාම එකතු වන්නේය.

## සබ්බාසව භාවනා

කොසජ්ජය ඇති නොවීම පිණිස විරිය තුනක් භාවිතා කළ බව සිහිකරන්න.

1) රූප ස්පර්ශ නොවීමට විරිය.

2) සංඥාව මගේ නොවීමට විරිය.

3) සංස්කාර මගේ නොවීමට විරිය.

3 වන පිටුවේ, ජාතිය සිට මනොසඤ්චෙතනාහාරය දක්වා ඇති රේඛාවෙන් වම් පැත්තේ ඇති ධර්මයන් මගින් ලෝභය නිරූපණය කරන බව දනිමු. එය තුළ කාමච්ඡන්දය ඇත. ක්ෂේත්‍ර 1 සහ ක්ෂේත්‍ර 2 අතර වෙනස නිසා කාමච්ඡන්දය හටගනී. කාමච්ඡන්දය යනු ජරා ධර්මයට ඇති කැමැත්තය. (3 වන පිටුවේ රතු රේඛාව බලන්න).

- අපි ජරා ධර්මයට කැමති නම් එයම මෝහය වන්නේය. පළමුවන විරිය ජරාවන රූපය ස්පර්ශ නොවීමටය.

## ක්ෂේත්‍ර 1 මගින් ක්ෂේත්‍ර 4 සැදේ.

## කුමක් නිසා ජරා ධර්මයට කැමති වන්නේද?

- ක්ෂේත්‍ර 4 දී හඳුන්වා දුන් අත්ත සංඥාව නිසයි මෙය ඇති වන්නේ. රූපය මගේ යැයි ගැනීමට උදව් උපකාර කරන්නේ අත්තා යැයි ගැනීමයි.




- අත්තා යැයි ගන්නේ වේදනාව පරාමාසයට ඇදීමයි. මෙම වේදනාව ජරාවට පත්වී ඇත, (4–3) වේදනාවේ ජරා ධර්මය.
- දෙවන වාරයේදී අපි කැමතිවී ඇත්තේ වේදනාවේ ජරාවටය. මෙය රූපය මගේ යැයි ගැනීමට උදව් උපකාර කරයි.

- දෙවන විරිය අත්ත සංඥාව මගේ නොවීමටය.

ක්ෂේත්‍ර 1 මගින් ක්ෂේත්‍ර 6 සෑදේ.

- ක්ෂේත්‍ර 6 හි ධර්මය කෙසේ ගලා යන්නේද?

විඥානය ප්‍රත්‍යය කොටගෙන නාම රූප (විඤ්ඤාණපච්චයා නාමරූපං) වීම මගින් ඉදංසච්චාභිනිවෙසො කායගන්ථය ඇතුලට ධර්මය ගැලීම සිදුවේ.




- එම අගය වැළපීම (පරිදෙව) දක්වා යෑම 5 රේඛාව මගින් නිරූපණය කරනු ලබයි.
- දැන් මෝහය නිසා උද්ධච්ච මගින් එම අගය පවත්වයි. එය 6 රේඛාව මගින් නිරූපණය කරනු ලබයි.
- මෙම අගයන් භය අගතිය දක්වා ගමන් කිරීමට උදව් උපකාර වන්නේ පෙර පරාමාස වූ ධර්මයෝය. එනම් සුබ යැයි වරදවා වටහාගත් ධර්මයයි. එය 7 රේඛාව මගින් නිරූපණය කරනු ලබයි. දැන් 7 රේඛාවේ උදව් උපකාරයෙන් 8 රේඛාව හරහා භය අගතිය දක්වා ගමන් කරයි. මෙය 11 වන රවුමට පසුව සිදුවේ. මෙසේ සංස්කාර නිසා අත්තා විය.

ක්ෂේත්‍ර 4 දී හඳුන්වා දුන් අත්ත සංඥාව වීමට කුමක් උදව් උපකාර කරයිද?

- ක්ෂේත්‍ර 4 දී හඳුන්වා දුන් අත්ත සංඥාව මගේ යැයි ගැනීමට උදව් උපකාර කරන්නේ ක්ෂේත්‍ර 6 දී සංස්කාර නිසා අත්තා වීමයි.
- 3 වන විරිය සංස්කාර මගේ නොවීමට, සංස්කාර නිසා අත්තා නොවීමට.

ක්ෂේත්‍ර 4 දී, වේදනාවේ ජරා ධර්මය මගේ යැයි ගන්නා ලදී, එය 4 වන රවුමේ **3** වන පියවරදී, සුඛ වශයෙන් වරදවා වටහා ගන්නා.




දැන් දිට්ඨි අනුසය මගින් රූපය සුඛ යැයි භාවිතා කරයි. මෙසේ රූපකායෙ අධිවචනසම්ඵස්සය සිදුවේ.

මෙසේම ක්ෂේත්‍ර 6 දී සංස්කාර නිසා ධර්මය ගැලීම සිතිය යුතුය. තුන් ආකාරයකට මෙය සිදුවේ.

1. උද්ධච්චය නිසා මිච්ඡාදිට්ඨිය මගින් ගැලීම සිදුවීම.
2. අවිද්‍යා ආශ්‍රව සිට කාමාශ්‍රව දක්වා යෑම මගින් ගැලීම සිදුවීම. මෙය ක්ෂේත්‍ර 2 හි සඞ්කප්ප පාරට තුඩුදේ.
3. 10 වන පිටුවේ, 8 වෙනි රේඛාව හරහා භය අගතිය දක්වා පැමිණියා නම් දිට්ඨි අනුසය හරහා ගැලීම සිදුවීම. මෙහිදී දෘෂ්ඨි සල්ලය (දිට්ඨිසල්ල) මගින් සංඥාව අල්ලාගෙන සිටියි. **5–3** දී සංඥාවේ ජරාව සිදුවී ඇත. දිට්ඨි ආශ්‍රව 8 වන රවුමෙන් පසුව සිදුවේ, මේ වන විට සංඥාව රෝගීය. එසේ නම් අපි කැමති වී ඇත්තේ සංඥාවේ ජරා ධර්මයට සහ සංඥාවේ ව්‍යාධියට වේ.

අවිද්‍යා ආශ්‍රව වීමට පෙර කාමාශ්‍රව වීම සිදුවිය. 4–4 න් පසුව කාමාශ්‍රව, 5 වන රවුමෙන් පසුව භවාශ්‍රව විය. 8 වන රවුමෙන් පසුව දිට්ඨි ආශ්‍රව විය. 10 වන රවුමෙන් පසුව අවිද්‍යා ආශ්‍රව විය. දැන් දහරාව ගලයි, රෝදය කැරකැවේ.

- කැරකැවෙන්නාවූ රෝදය තණ්හාව ලෙස දැකිය යුතුය.

අවිද්‍යා ආශ්‍රව වීම කාමාශ්‍රව වලින් සිදුවිය. දැන් කැරකැවෙන්නාවූ රෝදය, ගලන්නාවූ දහරාව, පැවත්වීම කාමාශ්‍රව සහ අනෙකුත් ආශ්‍රව මගින් සිදුකරයි.

- ස්ථාන දෙකකින් අදින සහ තල්ලු කරන බොස් ගෙඩිය (center hub) සහිතවූ රෝදයක් ගැන සිතන්න.

- කාමාශ්‍රව සිට භවාශ්‍රවයට කෙළින්ම සම්බන්ධතාවයක් නැත. දැන් මෙය වැටහේ.
- රෝදය කැරකැවෙන විට, භවාශ්‍රව නිසා ඇතිවූ සංඥා කොටස් ආශ්‍රවයට එකතු කරයි.
- ආශ්‍රව නැතිනම් දහරාව නොගලයි.

